00480

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව

උපාධි වැඩසටහන- 3වන මට්ටම 2020/2021

අවසාන පරීක්ෂණය

**EPU3532 - විෂයමාලා අධ්‍යයනය සහ ප්‍රායෝගික වැඩ -භාෂා අධ්‍යයනය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)**

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.01.14 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගන්නා ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## I වන කොටස

01. භාෂාව යනු කුමක්දැයි නිර්වචනය කරන්න.

02. භාෂාවේ කාර්යයන් තුනක් (03) සඳහන් කරන්න.

03. භාෂා අත්පත් කර ගැනීමේ අදියර මොනවා ද?

04. දරුවකුගේ වචන මාලාව කොටස් දෙකකට බෙදිය හැකිය. ඒවා මොනවා ද? කෙටියෙන් විස්තර කරන්න.

05. භාෂා ඉගෙනීම සම්බන්ධයෙන් මාධ්‍යයේ නැගී එන ආධිපත්‍යය (Emerging dominance) කෙටියෙන් පැහැදිලි කරන්න.

06. පෙර පාසල් දරුවන්ගේ පෙර ලිවීමේ කුසලතා වර්ධනය කිරීම සඳහා සුදුසු ක්‍රියාකාරකම් තුනක් (03) නිර්මාණය කරන්න.

07. භාෂා නිපුණතා තක්සේරු කිරීමේ අරමුණු කෙටියෙන් විස්තර කරන්න.

08. භාෂා නිපුණතා තක්සේරු කිරීමේ උපකරණ තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## II - කොටස

09. (i) ප්‍රාථමික සිසුන්ගේ භාෂා කුසලතා සංවර්ධනය කිරීම සඳහා සලකා බැලිය යුතු සාධක හතරක් (04) විස්තර කරන්න. (ලකුණු 10)

(ii) "භාෂා ඉගෙනීම අඛණ්ඩ ක්‍රියාවලියකි." ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ ද? ඔබේ පිළිතුරුට හේතු දක්වන්න. (ලකුණු 10)

10. (i) නිවසේ පරිසරය දරුවාගේ භාෂා වර්ධනයට සෘජුවම සහාය වේ. ඉහත ප්‍රකාශය සඳහා හේතු දක්වන්න. (ලකුණු 10)

(ii) පෙරපාසල් ගුරුවරුන් විසින් පෙරපාසල් දරුවන්ගේ භාෂාවේ ධනාත්මක වර්ධනයට දායක වන මාර්ග මොනවා ද? (ලකුණු 10)

11. (i) "මාධ්‍ය ඉගෙනීමේ නව මානයන් විවර කර ඇත." ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 10)

(ii) දරුවන් ජනමාධ්‍ය භාවිත කරන විට දෙමාපියන්ගේ වගකීම් මොනවා ද යන්න උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i) ප්‍රාථමික පන්තිවලින් ඕනෑම ශ්‍රේණියක් තෝරා සවන්දීම සම්බන්ධයෙන් එක් ගැටළුවක් තෝරා ගන්න. සිසුන්ගේ මෙම ගැටළුව මඟහරවා ගැනීම සඳහා සුදුසු ක්‍රියාකාරකම් තුනක් (03) සකස් කරන්න. (ලකුණු 10)

(ii) ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිසුන්ට ඉහත සඳහන් කළ එක් එක් ක්‍රියාකාරකමක් ඉදිරිපත් කිරීමට සුදුසු ඉගැන්වීමේ ක්‍රම මොනවාද යන්න විස්තර කරන්න. (ලකුණු 10)

13. (i) පෙරපාසල් ළමුන් සඳහා පෙරපාසල් ගුරුවරයා විසින් වර්ධනය කළයුතු පෙර භාෂා සංකල්ප ලැයිස්තු ගත කරන්න. (ලකුණු 05)

(ii) ඉහත සඳහන් කළ ඕනෑම සංකල්ප තුනක් (03) තෝරාගෙන එම එක් එක් සංකල්පයන් සඳහා ක්‍රියාකාරකමක් බැගින් සාදන්න. (ලකුණු 06)

(iii) පෙරපාසල් ගුරුවරුන්ට පූර්ව භාෂා සංකල්ප වර්ධනය කිරීමේ දී ඇතිවන ගැටළු මොනවා ද? (ලකුණු 04)

(iv) ඔබ ඉහත සඳහන් කළ ගැටළු දෙකක් (02) තෝරාගෙන එම ගැටළු සඳහා සුදුසු විසඳුම් යෝජනා කරන්න. (ලකුණු 05)

හිමිකම් ඇවිරිණි.